# මා ඔය දකුණු නිම්නයේ අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ආශ්‍රිත ජනාවාසකරණයේ දී භූ දර්ශනය හා පාරිසරික සාධකවල උපයෝගීතාව

## දීර්ඝ සාරාංශය

ශාලිකා කුරුනායක[1], එච්.ටී.සී.ඩී. හපුතන්ත්‍රි


### හැඳින්වීම

ස්වාභාවික ගංගා නිම්න පාදක කර ගනිමින් අතීත ලංකාවේ ජනාවාසකරණය සිදුවීමේදී මාඔය නිම්නය ආශ්‍රිත ප්‍රදේශය අතිශයින්ම වැදගත් වේ. මාඔය ආශ්‍රිත ව සිදුවූ ජනාවාසකරණය පිළිබද ව අවධානය යොමු කිරීමේදී පුරාණ ශ්‍රී ලංකාවේ මානව ජනාවාසරටාව පිළිබද වැදගත් කරුණු රාශියක් මෙ මඟින් අනාවරණය කර ගැනීමට හැකියාව ලැබේ. මධ්‍ය කදුකරයේ බටහිර බෑවුමේ අම්බුළුවාව කඳුවලින් මාඔය ආරම්භ වේ, අහුපිනි ඇල්ලෙන් පහළට ගමන්කරන මාඔය කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක, මාවනැල්ල, රඹුක්කන වැනි නගර ආසන්නයේ හා කුරුණෑගල දිස්ත්‍රික්කයේ අලව්ව, ගිරිඋල්ල, කොටදෙණියාව වැනි ප්‍රදේශ ඔස්සේ කිලෝ මීටර් 125.5 ක දුරක් ගමන්කර මීගමුවට තරමක් උතුරු දෙසින් මුහුදට එකතු වේ (විතානච්චි, 2011)

මාඔය පෝෂණ කලාපයන්ගෙන් එක් ප්‍රදේශයක් වන අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අතීත ජනාවාසකරණ ව්‍යාප්තියේ දී වැදගත් ප්‍රදේශයක් වේ. මෙම කලාපය තුළ ආදි මානවයා විසින් භූමියේ පිහිටීම උපයෝගීකර ගනිමින් ඔවුනගේ වාසස්ථාන නිර්මාණය කරගත් බවට සාධක ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට මෑත කාලීන යුගය දක්වා හඳුනාගත හැකි ය.

### අරමුණු

මෙම පර්යේෂණයේ අරමුණ වශයෙන් අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වන ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට මහනුවර රාජධානී සමය දක්වා කාල පරාසය තුළ වන මානව මැදිහත්වීම් සඳහා භූ දර්ශනය කෙසේ උපයෝගීකර ගෙන ඇතිදැයි හඳුනාගැනීම සඳහා පුරාවිද්‍යාත්මක හා භූ භෞතික සාධක මත පදනම් ව කරුණු අනාවරණය කරගැනීම ය.

### ක්‍රමවේදය

මෙම කරුණු අනාවරණය කරගැනීම උදෙසා පූර්ව පර්යේෂණ අධ්‍යයනය සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර අධ්‍යයනය සිදු කරන ලදී. පුරාවිද්‍යාත්මක සාධක අනාවරණයකර ගැනීම සඳහා අධ්‍යයන කලාපයට අයත් ග්‍රාම සේවා වසම් ඔස්සේ ගවේෂණ දියත්කරන ලදී.

### ප්‍රතිඵල සාකච්ඡාව

මෙහි ප්‍රතිඵල සාරාංශ ගත කිරීම තුළින් භූමි පරිභෝජන රටාවන් ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ක්‍රියාකාරකම් සඳහා පරිසරයේ උපයෝගීතාවය හඳුනාගැනීම සදහා හක්බෙලි කන්ද ප්‍රාග් ඓතිහාසික ජනාවාසය වැදගත් වන අතර මෙහිදී ගල් ලෙනක් කෙසේ සිය වාසස්ථාන ලෙස සුදුසු පරිදි මානවයා සකස් කර ගත්තේ ද යන කරුණට අදාළ ව සාධක රැසක් හඳුනාගත හැකි විය. පාරිසරිකමය සාධක අනුව බලන කල ආහාර සහ ජල අවශ්‍යතා මනාව සපයා ගත හැකි ස්ථාන අළලා සිය වාසස්ථාන ඉදිකර ගැනීමට අතීත මානවයා පෙළඹුණු ආකාරය මෙම කරුණු ඔස්සේ හඳුනාගත හැකි විය.

මෙයට පසු ව බුදු දහම මෙරට ස්ථාපිත වීමෙන් අනතුරුව විහාරාරාම ඉදිකිරීමේදී උස් භූමි හා කඳු ශිඛර ආශ්‍රිත ව ලෙන් ආරාම ඉදි කිරීම හඳුනාගත හැකි ය. මාඔය ආශ්‍රිත කලාපයේ ඇති වැදගත් ස්ථාන වශයෙන් ගනේකන්ද රජමහා විහාරය, ,මඩවල විහාරය, .හක්බෙලි කන්ද ලෙන් ආරාමය වැනි ස්ථාන සුවිශේෂී වේ. මෙහිදී අනුරාධපුර යුගයෙන් පසුව හඳුනාගත හැකි අනෙකුත් යුගයන් හී සාධක මෙම විහාරාරාම ආශ්‍රයෙන් අඩු වැඩි වශයෙන් හඳුනාගත හැකි ය. මෙයට අමතර ව පාරිසරික හා භූ දර්ශනය යන සාධකයන් ට අනුව කරුණු අනාවරණය කරගැනීමේදී කිරීමේදී සාම්ප්‍රදායික ගම්මාන හා කර්මාන්ත බිහිවී එම සම්ප්‍රදායන් ව්‍යාප්ත වන ආකාරය හඳුනාගත හැකි ය. එ බඳු සාම්ප්‍රදායික ලක්ෂණ ප්‍රකට කරන ගම්මානයක් වශයෙන් ගලතරේ පුරාණ ගම්මානය පෙන්වාදිය හැකි ය.

කෘෂිකාර්මික කටයුතු වලදී වාරි කර්මාන්ත බිහිකිරීමට භූ දර්ශනයේ උපයෝගීතාවය මනාව යොදා ගත් බවට සාධක ද මාඔය නිමනයේ අධ්‍යයන ක්ෂේත්‍රය තුළින් හඳුනාගත හැකි ය. එමෙන්ම එම පාරිසරික සාධක උපයෝගීකර ගනිමින් විවිධ වාස්තු විද්‍යාත්මක නිර්මාණ සිදුකිරීම ද හඳුනාගත හැකි ය.

උක්ත දක්වන ලද ආකාරයට මෙම කලාපය ආශ්‍රිත ව ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ඓතිහාතික අවධියත් ඉන් පසු කාලීනවත් භූ දර්ශනය හා පාර්සරික සාධක අතීත ජනාවාසකරණ කටයුතු සඳහා මනාව භාවිත කර ඇති බවට සාධක රාශියක් මෙම පර්යේෂණයේ දී අනාවරණය කර ගැනීම ට හැකි විය.



### මූඛ්‍ය පද

භූ දර්ශනය, වාස්තුවිද්‍යා නිර්මාණ, ජනාවාසකරණය, පාරිසරික සාධක, මාඔය දකුණු නිම්නය


### ආශ්‍රිත ග්‍රන්ථ


Deraniyagala,S.U, 1992, ***The Pre History of Sri Lanka 1,2,*** Colombo, Department of Archaeology.

විතානච්චි, සී. ආර්, 2011, *මානවශ්‍රාස්ත්‍ර අධ්‍යයනය*, සමාජීයවිද්‍යා හා මානව ශ්‍රාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය මිහින්තලය.

2002, *වයඹ පළාතේ පැරණි ස්මාරක*, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව


[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය , ශ්‍රී ලංකා ලරජරට විශ්ව විද්‍යාලයල ශ්‍රී ලංකාව ග